# වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

## උසස් අධ්‍යාපන තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යාංශය

# 2020 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කරගැනීම

**ජාතික වෘත්තීය සුදුසුකම්ලාභීන්ට (NVQ - SL) 5/6 අයදුම් කළ හැක.**

**2019 අ.පො.ස. උසස් පෙළ සමතුන්ටද සතියේ දින උපාධි පාඨමාලා සඳහා අයදුම් කළ හැක.**

## සතියේ දින සහ සති අන්ත උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම

**මාධ්‍යය : ඉංග්‍රීසි**

**අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය :** 2020 ජනවාරි 18

NVQ 5 **හෝ ඊට සමාන ඩිප්ලෝමා පාඨමාලාවන් හැදෑරූ අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය : 2020 පෙබරවාරි 16**

උක්ත විභාගය පිළිබඳ අයදුම්කරුවන් දැනුවත් කරනු ලබන අතර එලෙස දැනුම් දීමක් 2020 පෙබරවාරි 16 දින තෙක් නොලබන්නේ නම් ඒ පිළිබඳ විශ්වවිද්‍යාලයෙන් විමසීම අයදුම්කරුවන්ගේ වගකීම වේ.

සතියේ දින උපාධි පාඨමාලා සඳහා NVQ 5/6 හෝ ඊට සමාන ඩිප්ලෝමා පාඨමාලාවන් හැදෑරූ අයදුම්කරුවන් වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දෙමින් ඉතිරි පුරප්පාඩු සඳහා **2019 අ.පො.ස. උසස් පෙළ සමත් සිසුන්ගේ Z අගය** පදනම් කර ගනිමින් ඔවුන් සඳහා අවස්ථාව ලබා දේ.

අදාළ පාඨමාලාවන්ට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

# උපාධි පාඨමාලා

| උපාධි පාඨමාලා | සුදුසුකම් ලබන විශේෂ තාක්ෂණික ක්ෂේත්‍රයන් NVQ 5/6 | සුදුසුකම් ලබන ධාරාවන් අ.පො.ස. උසස් පෙළ |
|---|---|---|
| **ඉංජිනේරු තාක්ෂණ පීඨය** | | |
| 1. මෙකාට්‍රොනික් තාක්ෂණය | මෙකාට්‍රොනික්, විදුලි, විද්‍යුත්, යාන්ත්‍රික, නිෂ්පාදන සහ මෝටර් රථ තාක්ෂණය, ජෛව වෛද්‍ය | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 2. ගොඩනැගිලි සේවා තාක්ෂණය | ඉදිකිරීම්, සිවිල්, යාන්ත්‍රික, ශීතකරණ හා වායුසමීකරණ, විදුලි, ගොඩනැගිලි සේවා, විද්‍යුත් සහ විදුලි සංදේශ | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 3. නිෂ්පාදන තාක්ෂණය | නිෂ්පාදන, මෙකාට්‍රොනික්, ශීතකරණ හා වායුසමීකරණ, යාන්ත්‍රික, මෝටර් රථ තාක්ෂණය, පැස්සුම්, කෘෂි යන්ත්‍රෝපකරණ, රසායනික සහ බහු අවයවික තාක්ෂණය | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 4. ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමනාකරණය | ඉදිකිරීම් තාක්ෂණය | ඉංජිනේරු තාක්ෂණවේදය |
| **කර්මාන්ත තාක්ෂණ පීඨය** | | |
| 1. ආහාර සැකසුම් තාක්ෂණය | ආහාර, කෘෂිකර්ම, සූපවේදය, පශු සම්පත් සහ කිරි නිෂ්පාදන, ආහාර තත්ව සහ ආහාර රසායනය විද්‍යාව | ජෛව පද්ධති තාක්ෂණවේදය, ජෛව විද්‍යාවන් |
| 2. සිනමා සහ ටෙලිවිෂන් නිෂ්පාදන තාක්ෂණය (සති අන්ත) | සිනමා, ටෙලිවිෂන්, විඩියෝ නිෂ්පාදනය සහ ඩිජිටල් මාධ්‍ය තාක්ෂණය | - |
| 3. මාධ්‍ය කලා නිෂ්පාදන තාක්ෂණය (සතියේ දින) | ජනමාධ්‍ය නිෂ්පාදනය, ජනසන්නිවේදනය, මුද්‍රිත, රේඩියෝ, සිනමා, ටෙලිවිෂන්, ශ්‍රව්‍යදෘෂ්‍ය මාධ්‍ය, නවමාධ්‍ය, ජනමාධ්‍යවේදය | උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමඟ සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය විෂයක් ලෙස |
| 4. කර්මාන්ත කළමනාකරණ තාක්ෂණය | ඕනෑම තාක්ෂණික හෝ වෘත්තීය ක්ෂේත්‍රයක් | වාණිජ, ඉංජිනේරු තාක්ෂණවේදය, භෞතිය විද්‍යා |
| 5. හෝටල් කළමනාකරණය (සති අන්ත) | ආගන්තුක සත්කාර කළමණාකරන/හෝටල් සහ සංචරණ | - |
| 6. ප්‍රමාණ සමීක්ෂණ | ප්‍රමාණ සමීක්ෂණය | - |
| **තොරතුරු තාක්ෂණ පීඨය** | | |
| 1. මෘදුකාංග තාක්ෂණය | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| 2. බහුමාධ්‍ය සහ වෙබ් තාක්ෂණය | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය | උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| 3. ජාල තාක්ෂණය | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, විදුලි සංදේශ | උසස් පෙළ ඕනෑම විෂය ධාරාවක් සමග තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂයක් ලෙස |
| **අධ්‍යාපන පීඨය** | | |
| 1. අධ්‍යාපන තාක්ෂණවේදි උපාධිය | සියලු තාක්ෂණික ක්ෂේත්‍රයන් | - |
| 2. අධ්‍යාපනවේදි උපාධිය (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම) | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා හෝ උසස් ඩිප්ලෝමා | උසස් පෙළ කළා විෂයධාරාව සමඟ ඉංග්‍රීසි විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඕනෑම විෂය ධාරාවක් සමඟ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් |

## තාක්ෂණික උපාධි පාඨමාලා සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්

I. ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 හෝ ඊට ඉහළ **හෝ**

ii. විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව මගින් පිළිගනු ලබන ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි HNDE, HNDQS, HNDA, NDT, NDES, NDET හෝ සමාන සුදුසුකම් **හෝ**

iii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික වෘත්තීය සුදුසුකම් 5 හෝ 6 මට්ටමට සමාන යැයි පිළිගනු ලැබූ සුදුසුකමක්.

## හෝටල් කළමණාකරන උපාධි පාඨමාලා සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්

I. ආගන්තුක සත්කාර කළමණාකරන/හෝටල් සහ සංචරණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 හෝ ඊට ඉහළ **හෝ**

ii. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන හෝ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව මගින් පිළිගනු ලබන විදේශීය ආයතන මගින් පිරිනමනු ලබන හෝටල් හා සංචරන ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් අවුරුදු පූර්ණ කාලීන හෝ ඊට සමාන අර්ධ කාලීන සුදුසුකම් සහ තරු 3 හෝ ඉහල හෝටලයක අවම වශයෙන් අවු.02 ක පළපුරුද්ද.

මධ්‍යම කළමණාකරන මට්ටමේ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට, විශ්වවිද්‍යාලය මගින් පත්කරනු ලබන කමිටුවක් මගින් ඇගයීමෙන් පසුව ප්‍රමුඛතාවය හිමිවේ.




## අධ්‍යාපන උපාධි පාඨමාලා සඳහා ඇතුළත්වීමේ සුදුසුකම්

### අධ්‍යාපන තාක්ෂණවේදී උපාධිය

1. ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 හෝ ඊට ඉහළ **හෝ**
2. විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව මගින් පිළිගනු ලබන ඉහත සඳහන් කරන ලද අදාළ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි HNDE,NDT,NDES,NDET,NDICT සුදුසුකම් **හෝ**
3. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් 5 හෝ 6 මට්ටමට සමාන යැයි පිළිගනු ලැබූ සුදුසුකමක් **හෝ**
4. ජාතික අධ්‍යාපන පීඨයන්හි ලබා දෙන පුහුණුව යටතේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් පිරිනමනු ලබන (ඉහත තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අදාළ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව විසින් පිළිගනු ලබන) ඩිප්ලෝමා සහතිකය.

   අදාළ සහතිකය ලබා ගැනීමෙන් පසු එම ක්ෂේත්‍රයන්හි ඉගැන්වීම හෝ කර්මාන්ත ආශ්‍රිත අවම වශයෙන් අවුරුදු 01 ක පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාව හිමිවේ.

### අධ්‍යාපනවේදී උපාධිය (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම)

1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ඉංග්‍රීසි සහ අධ්‍යාපනය පිළිබඳ NVQ 5 ඩිප්ලෝමා සහතිකය හෝ NVQ 6 උසස් ඩිප්ලෝමා සහතිකය **හෝ**
2. ජාතික අධ්‍යාපන ආයතනය මගින් අධ්‍යාපන පීඨවල පවත්වන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමාව **හෝ**
3. ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පිරිනැමූ ජාතික පුහුණු තාක්ෂණ ඩිප්ලෝමාව (ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම) **හෝ**
4. ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනය මගින් පිරිනැමූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව **හෝ**
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉංග්‍රීසි පුහුණු ගුරු සහතිකය **හෝ**
6. ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය හෝ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් පිරිනැමූ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව සහ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සභාව විසින් පිළිගනු ලබන ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම ඇතුළත් වන සුදුසුකම් සහතිකයක්

**සටහන**

* තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තහවුරු කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 ට සමාන සුදුසුකම් සඳහා එම ආයතනය මගින් නිකුත් කරනු ලැබූ ලිඛිත සහතිකයක් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු අතර අනෙකුත් ඩිප්ලෝමා සුදුසුකම් සඳහා, ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු කිරීම් අධිකාරියේ, ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර සමාන කිරීමේ කමිටුව මගින් නිකුත් කරන ලද ලිඛිත සහතිකයක් අමුණා එවිය යුතුය

* ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 6 හෝ සමාන සුදුසුකම්හි අදාළ මොඩියුල සහ උපාධි පාඨමාලාවන්හි අඩංගු මොඩියුල පිළිබඳ විධිමත් ඇගයීමකින් පසුව උපාධි පාඨමාලාවේ යම් මොඩියුල හැදෑරීමෙන් අයදුම්කරුවන් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

එක් අයදුම්කරුවෙකුට යොමුකළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත www.univotec.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක. දැනට රැකියාවක නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත අදාළ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2020 ජනවාරි මස 18 වන දිනට හෝ එයට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන උපාධි පාඨමාලාව සහ NVQ හෝ අ.පො.ස. උසස් පෙළ සුදුසුකම්වලින් අයදුම් කරන්නේද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුය. අයදුම්පත් යොමු කිරීම සඳහා රු. 1000 ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුව, රත්මලාන ශාඛාවේ ගිණුම් අංක 0070308457 ට බැර කළ යුතු අතර අයදුම්පත සමඟ අදාළ මුදල් ගෙවූ ලදුපත සහ සුදුසුකම් සහතිකයේ පිටපත අමුණා එවිය යුතුය.

(වැදගත් ඃ අසම්පූර්ණ සහ මුදල් ගෙවූ ලදුපත අමුණා නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

අධ්‍යක්ෂ ජනරාල්
වෘත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය
100, කඳවල, රත්මලාන
දුරකථන : 0112 630700 දිගු අංක : 1101 / 1102
ශිෂ්‍ය සේවා අංශය : 0112 630701 ෆැක්ස් : 0112 630705

වැඩිදුර තොරතුරු සඳහා වෙබ් අඩවියට පිවිසෙන්න
**www.univotec.ac.lk**

2008 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත,
පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය දරණ රාජ්‍ය විශ්වවිද්‍යාලයකි.